5

අල් කලාඋ වල් කද්ර්

පන්තියට පැමිණි ගුරුතුමා සිසුන් දෙස බලා "අද මොක ද වෙනදට වඩා ඔබ නිහඬ ව සිටින්නේ?" යැයි විමසුවේ ය. නමුත් එකිනෙකා මුහුණට මුහුණ බලා ගත්තා පමණි. කිසිවෙක් පිළිතුරු නොදුන්නෝ ය. ගුරුතුමා නැවත නැවත විමසුව ද එහි නිහඬතාව පමණක් පැවතුණි. අවසානයේ දී ගුරුතුමා නුස්රි නම් සිසුවා කැඳවා හේතු විමසුවේ ය.

නුස්රිඃ- අපට සමාවෙන්න සර්. අද විභාග ප්‍රතිඵල පිටවීමට නියමිතයි. අපගේ ප්‍රතිඵල කෙසේ වේදෝ යැයි අපි සිතන්නෙමු. එහෙයින් අපගේ සිත් නොසන්සුන් ය.

ගුරුතුමාඃ- මේක ද ප්‍රශ්නය? අල්ලාහ්ගේ අභිමතය පරිදි සියල්ල සිදුවේ. ඔබ උනන්දුවෙන් ඉගෙන ගත්තෙහු ය. විභාගය ලීවෙහු ය. ජය - පැරදුම අල්ලාහ්ට භාර දුන්නෙහු ය. පසුතැවිලි නොවී අල්ලාහ්ගේ තීන්දුව පිළිගැනීම මූඃමින්වරයකුගේ ගුණාංගයකි.

ඉනායතුල්ලාහ් ඃ- ඒක කොහොම ද සර් වෙන්නේ, විභාගය ලියන්නේ අපිනේ. අපට ලැබෙන ප්‍රතිඵල සමග අල්ලාහ් කොහොම ද සම්බන්ධ වෙන්නේ?

ගුරුතුමාඃ- ටිකක් නිහඬ ව සිටින්න. මේක හොඳ අවස්ථාවක් අපගේ විශ්වාසනීය ප්‍රතිපත්තීන් අතර අප ඊමාන් කළ යුතු වැදගත් කරුණක් පිළිබඳ ව ඉගෙන ගැනීමට අවස්ථාවක් ලැබී තිබෙනවා. ජය පරාජය තුළ මධ්‍යස්ථ භාවය රැක ගැනීමට මෙම කරුණ සහය වෙනවා.

නෂාත්ඃ- සර්. ඔබ කියා දෙන කරුණ පිළිබඳව මමත් දන්නවා. කලා කද්ර් පිළිබඳව නේද, සර්?

ගුරුතුමාඃ- හරියට ම කිව්වා. අපගේ සිසුන් දක්ෂයි. ඉක්මනින් සියල්ල වටහා ගන්නවා.

රිෆායිඃ- කලා කද්ර් පිළිබඳ ව ඉගෙන ගනිමු සර්.

ගුරුතුමාඃ- ප්‍රථමයෙන් ම අකීදා පිළිබඳව ඉගෙන ගනිමු. ඉස්ලාමීය විද්වත්හු කලා කද්ර් "ඉලාහියියාත්" නම් කොටසට එක්කර ඇත. මෙලොව හා මිනිස් ජීවිතය තුළ යහපත - අයහපත යන සියල්ල ම අල්ලාහ්ගේ අභිමතය පරිදි සිදු වේ, යන්න විශ්වාස කිරීම කලා කද්ර් හා සබැඳි විශ්වාසය වේ. මේ පිළිබඳ ව අපි තරමක් දුරට ඉගෙන ගනිමු.

අපි අල්ලාහ් කෙරෙහි ඊමාන් තබන විට ඔහුට අයත් ගුණාංග (සිෆාත්) සම්පූර්ණයෙන් ම විශ්වාස කළ යුතු ය. පූර්ණ දැනුම (ඉල්ම්) පූර්ණ අභිමත බලය (ඉරාදත්) ක්‍රියාකරවීමේ බලය (කුද්රත්) සාධාරණ නීතිය (අද්ල්) අල්ලාහ්ට ම පමණක් හිමි ය, යන්න ස්ථිර ව විශ්වාස කළ යුතු ය. කලා කද්ර් පිළිබඳ විශ්වාසය මෙම විශ්වාසයේ එක් කොටසකි.

ඉනාමුල්ලාහ්ඃ- උදාහරණ සමග පහදන්න පුළුවන් ද සර්.

ගුරුතුමාඃ- ඉක්මන් වෙන්න එපා. පියවරින් පියවර තේරුම් කර දෙන්න උත්සාහ කරන්නම්. අල්ලාහ්ට සමාන දැනුමක් කිසිවකුටත් නොමැත. ඔහුගේ දැනුම අති විශාල ය; අසීමිත ය. කුඩා කුහුඹුවකු ගලක් තුළට රිංගා යෑම ද ග්‍රහමණ්ඩලයේ ග්‍රහලෝක භ්‍රමණය වීම ද මිනිස් සිත් තුළ ඇති කරන්නා වූ හැඟීම් ද ඔහු දැන සිටින්නේ ය. මේ

සියල්ල ම "ලව්හුල් මහ්ෆූල්" නම් එලකයේ සටහන් කර ඇත. ඒ සියල්ල ම නියත වශයෙන් ම සිදු වේ. එහි කිසිවක් වරදින්නේ නැත, යැයි විශ්වාස කිරීම අපහට අනිවාර්ය ය. අල්ලාහ් මේ පිළිබඳ ව අල්කුර්ආනයේ පැවසූ බව හොඳින් අවධානයට ගන්න.

"තව ද නබිවරයාණනි, අහසෙහි හා පොළොවෙහි ඇති දෙයින් එක් අංශුවක් හෝ නුඹගේ දෙවියන්ට නොදැනී සැඟවෙන්නේ නැත. තව ද, මෙයට වඩා කුඩා හෝ විශාල හෝ කිසිවක් ඔහුගේ පැහැදිලි ලව්හුල් මහ්ෆූල් එලකයෙහි සඳහන් නොවී නොමැත." (10: 61)

අබ්දුල් කාදිර්:- එසේ නම්, එම ලව්හුල් මහ්ෆූල්හි ලියා තබන ලද ආකාරයට ම අපගේ ක්‍රියාවන් සිදු වේ ද? විභාග ප්‍රතිඵලත් එසේ ම ද?

ගුරුතුමා:- හොඳ ප්‍රශ්නයක්. "කලා" යනු අල්ලාහ් ඔහුගේ දැනුමට හා හැකියාවට අනුව විශ්වය හා එහි සියල්ල මැවුවේ ය, යන්න වේ. එනම්, තීන්දු කරන ලදී, යන අදහස ද අන්තර්ගත වේ. "කද්ර්" යනු මැවීම් සියල්ල ම කවදා, කොතනක, කුමන හැඩයක් හැකියාවක් ඇතිව බිහි වේ ද, යන අල්ලාහ්ගේ දැනුම පිළිබඳ අදහස ද අන්තර්ගත වේ.

කලා කද්ර් යන්නෙහි සිංහල කෙටි අර්ථය පෙරමිනුම, නැතිනම් දෛවය යන්නයි. මෙම කලා කද්ර් මිනිස් ජීවිතය තුළ දෙආකාරයෙන් ක්‍රියා කරයි. අල්ලාහ්ගේ දැනුම හා අභිමතය පරිදි සම්පූර්ණයෙන් ක්‍රියා කිරීම එක් ආකාරයකි. එහි මිනිසාට කිසිදු අයිතියක් නොමැත. ඔහුගේ කැමැත්තට හා අකමැත්තට කිසිදු ඉඩක් නොමැත. මෙම අංශයට අදාළ ව පරලොවේ දී ඔහු අල්ලාහ්ගේ විමසීමට ද ලක් නොවේ. උපන්නේ කොහි ද? උපන්නේ කවරෙකුට ද? මිනිස් ස්වරූපය, ආයු කාලය යනාදිය මෙම අංශයේ අන්තර්ගත වේ.

නියත වශයෙන් ම අහසේ හා පොළොවේ ඇති කිසිවක් අල්ලාහ්ට වසං නොවේ. ඔහු කෙබඳු ද යත්, ගර්භාෂය තුළ තමන් කුමක් අභිමත කරන්නේ ද එසේ ම නුඹලා හැඩගස්වන්නේ ය. (3 : 5-6) යන අල්කුර්ආන් වැකියෙන් මෙය පිළිබිඹු කරයි.

ජාබිර්:- එසේ නම්, යහපත - අයහපත, ස්වර්ගය - නිරය ආදිය මැවීමේ අවශ්‍යතාවය කුමක් ද?

ගුරුතුමාඃ- යහපත - අයහපත තිබීම ද, ස්වර්ගය - නිරය තිබීම ද සත්‍යයකි. මෙය නිවැරදි ව වටහා ගැනීමට නම් කලා කද්ර්හි දෙවන අංශය පැහැදිලි ව දැන ගත යුතු ය. දෙවන අංශය ප්‍රථම අංශයට වඩා වෙනස් ය.

මේ අංශය මිනිසාගේ නිදහස, ඔහුගේ කැමැත්ත - අකමැත්ත සමග සම්බන්ධ වේ. මිනිසා අල්ලාහ් විසින් දැනුම ලබා දෙන ලද, ක්‍රියා කිරීමේ ශක්තිය ලබා දෙන ලද මැවීමකි. ඔහු කුමන ක්‍රියාවක් සිදු කළ ද එහි ඔහුගේ අභිමතය රැඳී පවතී. අල්ලාහ් මෙම අභිමත හැඟීම මිනිසා තුළ කොතරම් ප්‍රසාරණය කර ඇති දැයි කිවහොත් අල්ලාහ් විශ්වාස කිරීමෙහි ලා මිනිසාගේ කැමැත්තට අවස්ථාව ලබා දී ඇත.

"කැමති නම් විශ්වාස කරනු; කැමැති නම් ප්‍රතික්ෂේප කරනු," (18 : 29) යන කුර්ආන් වැකිය මෙයට සාධකයකි.

රියාල්දීන්:- සර්. සියල්ල ම ලව්හුල් මහ්ෆූල්හි සඳහන් වන පරිදි සිදු වන බව ඔබ මීට පෙර පැවසුවා නේ ද? නමුත් දැන්, මිනිසා ස්වකීයව ක්‍රියා කරන බව පවසනවා. දෙක ම එකිනෙකට පටහැනියි වගේ නේද?

ගුරුතුමාඃ- එසේ නොවේ. මෙහි කිසි දු පටහැනි බවක් නොමැත. මෙය අල්ලාහ්ගේ ඥානය හා සම්බන්ධ වේ. ඔහු මැවුම්කරුවා ය. ඔහු අනාගතය, වර්තමානය, අතීතය යන කාල තුන ම දැන සිටින්නා ය. ඔහු නොදැනුවත් ව මෙම පොළෝ තලයේ කිසිවක් සිදු නොවේ. මෙය උදාහරණ සමග ගෙන හැර දැක්වීම හොඳයි කියලා මට හිතෙනවා.

මිනිසෙකුගේ ඡායාරූපයක් ගෙන බලන්න. එය එම මිනිසාගේ අතීත කාලය ගෙන හැර දක්වයි. ඔහු තමන් අලංකරණය කර ඡායාරූපය ගෙන තිබුණේ නම් ලස්සනට පෙනේ. නොසැලකිල්ලෙන් ඡායාරූපය ගෙන තිබුණේ නම් එහි ලස්සන රුවක් දක්නට නොලැබේ. එනිසා එම ඡායාරූපයට වර්ණනා කිරීම හෝ පිළිකුල් කිරීම හෝ කළ නොහැකි ය. මක්නිසාදයත් එය ඔහු විසින් ම සකසා ගත් අතීත කාල ප්‍රතිබිම්බයකි.

එසේ ම යමෙකු සිනහමුසු මුහුණින් කන්නාඩිය ඉදිරිපිට සිටියහොත් ඔහුගේ සිනහමුසු වන ප්‍රතිබිම්බය ද, කෝපයෙන්

කන්නාඩිය ඉදිරිපිට සිටියහොත් කෝපයෙන් පිරි ප්‍රතිබිම්බය ද දිස් වේ. එනිසා කන්නාඩිය වර්ණනා කිරීම හෝ එය සමග උරණ වීම හෝ හරි ද?

ඡායාරූපය අතීත කාලය විදහා දක්වනවාත් සේ කන්නාඩිය වර්තමාන කාලය විදහා දක්වයි. ළමයිනේ! ඔබ දූන් ටිකක් සිතා බලන්න. මිනිසාගේ අතීතය, වර්තමානය විදහා දක්වන උපකරණ නිර්මාණය කළ අල්ලාහ්ට අනාගතය පෙන්වන උපකරණයක් නිර්මාණය කිරීම කළ නොහැකි කාර්යයක් ද? ඔහුට එය සිදු කළ හැකි ය. එය ලව්හුල් මහ්ෆූල් වේ.

මෙම ලව්හුල් මහ්ෆූල් අනාගතය විදහා දක්වූව ද මිනිසාගේ ක්‍රියාවන්ට ලව්හුල් මහ්ෆූල් හේතුව ලෙස දක්වීම සාධාරණ ද? ඡායාරූපය අතීත කාලයටත් කන්නාඩිය වර්තමානයටත් වග නොකිය යුතු සේ ම ලව්හුල් මහ්ෆූල් අනාගතයට වග නොකිය යුතු යි, යන්න සාධාරණ ය.

නස්රුල්ලාහ්:- ලව්හුල් මහ්ෆූල්හි ක්‍රියාවන් සියල්ල ම සටහන් වූ නිසා ක්‍රියාවන් සිදු කරන ලෙසට මිනිසාට බල කරනු ලැබේ ද?

ගුරුතුමා:- නැත. මෙහි කිසිදු බල කිරීමක් නොමැත. නමුත් මිනිසා ස්වකීයව සිදු කරන්නාවූ ක්‍රියාව අල්ලාහ් දූන සිටින්නේ ය, යන්න මෙහි අදහස වේ.

රම්සි:- යමෙකුට, ලව්හුල් මහ්ෆූල් හේතුව ලෙස දක්වා තම ක්‍රියාවන් වෙනුවෙන් වග නොකියා නිදහස් විය හැකි ද?

ගුරුතුමා:- එසේ නිදහස් විය හැකි නම් මිනිසාට මගපෙන්වීම සඳහා රසූල්වරුන්, නබිවරුන්, ආගම් ආදිය පහළ කිරීමෙහි අර්ථයක් නොමැති වේ.

සියාද්:- සර් බොහොම ස්තුතියි; කලා කද්ර් පිළිබඳ ව හොඳින් වටහා ගත්තෙමු.

"අල්ලාහ් අභිමත වූවා නම් පමණක්, නුඹලාට අභිමත විය හැකි වන්නේ ය." (76: 30) යන කුර්ආන් වැකියෙන් කුමක් අර්ථවත් කරන්නේ ද?

ගුරුතුමා:- මෙයට අර්ථ දෙකක් ඇත. එකක් කැමැත්ත යන ක්‍රියාව අල්ලාහ් විසින් ඇති කරන ලදී. එහෙයින් මිනිසා යම් කරුණක් ස්වකීයව ඉටු කළ ද එය අල්ලාහ්ගේ කැමැත්ත ය.

අනෙක මිනිසා සියල්ල ම ස්වකීයව ඉටු කළ යුතු ය, යන්න ද අල්ලාහ්ගේ කැමැත්ත වේ. මේ අනුව මෙහි අදහස තමන් ම ස්වකීයව යමක් ඉටු කළ ද එය අල්ලාහ්ගේ කැමැත්ත ලෙස ම පවති, යන්න ය.

මෙයට උදාහරණයක් ගෙන හැර දක්වන්නම්. ගොවියෙකු බීජ තම කැමැත්ත පරිදි තෝරා ගනියි. අල්ලාහ් එයට අස්වැන්න ලබා දෙන්නේ ය. පලතුරු බීජ සිටුවුව හොත් පලතුරු ද, මල්පැල සිටුවුවහොත් මල් ද ලැබේ. එය සිදු කරනු ලැබුවේ කවුරුන් ද, නියත වශයෙන් ම ඔහු අල්ලාහ් හැර වෙන කිසිවෙක් නොවේ. මෙහි දී මිනිසාගේ කැමැත්තට නිදහස ලැබී ඇත. එයට අවසාන ප්‍රතිඵලය තීන්දු කරන්නේ අල්ලාහ්ගේ කැමැත්ත ම ය, යන්න අප වටහා ගත යුතු ය. මේ අනුව කලා කද්රයේ දෙවන අර්ථය තුළ මිනිස් ක්‍රියාවට මිනිසා වගකිව යුත්තෙකි, යන්න පැහැදිලි නොවේ ද?

නෆ්හාන්:- අපගේ විභාග ප්‍රතිඵලවලට අප ද වග කිව යුත්තේ?

ගුරුතුමා:- සියලු ම දෙනා තම තමන්ගේ උත්සාහයට අනුව ප්‍රතිඵල ලබා ගනිති. එම අවසාන ප්‍රතිඵලය අල්ලාහ්ගේ ඥානයට හා අභිමතයට අනුව සිදු වේ, යන්න අප විශ්වාස කළ යුතු ය. මුස්ලිම්වරයකු, අල්ලාහ්ගේ පෙර මිනුම වන කලා කද්ර් පිළිගත යුතු අතර ඒ සඳහා ස්වකීයව උත්සාහය ද දැරිය යුතු ය. "යා අල්ලාහ් දැනුම වර්ධනය කර දෙනු මැනව!" යැයි (දුආ) ප්‍රාර්ථනා කරමින් සිටීම පමණක් නොසෑහේ. ප්‍රාර්ථනා කරන අතරතුර ඉගෙන ගත යුතු ය. සියල්ල අල්ලාහ්ගේ අභිමතය පරිදි සිදු වේ, යැයි පවසමින් විවේකී ව සිටීමට ඉස්ලාම් දහම උත්සුක කර නැත. බද්ර් සටන අවස්ථාවේ දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා දැරූ උත්සාහයන් මෙයට සාධක ලෙස ගත හැකි ය.

නස්රුල්ලාහ්:- සර්, පන්තියට පැමිණෙන විට අපි විභාග ප්‍රතිඵල පිළිබඳ ව සිත සිතා පැකිලීමකින් සිටියෙමු. දැන් අපි හිසේ තිබූ බර බිම තබා සතුට විඳින්නන් සේ සිටින්නෙමු.

ගුරුතුමා:- ඔබ කිවුවා හරි. කලා කද්ර් විශ්වාස කිරීමෙන් තවත් ප්‍රයෝජන රැසක් හිමි වේ. ඒවා ලැයිස්තු ගත කර පෙන්වීම යහපත් යැයි සිතමි.

01. අල්ලාහ් ප්‍රදානය කළ දැයින් තෘප්තිය ලබා ජීවත් වීමට එය මග පෙන්වයි.
02. නිර්මාණ බිහි කිරීමෙහි ලා එය උනන්දු කරවයි.
03. බියජනක අවස්ථාවල දී ධෛර්යයෙන් ක්‍රියා කිරීමට උනන්දු කරයි.
04. අයහපතට එරෙහි ව ස්ථාවර කරයි.
05. දුක, ශෝකයේ දී ඉවසීමෙන් සිටිය යුතු ය.

මෙම පාඩමේ දී කලා කද්ර් වටහා ගැනීමට ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමා දැනුම් දීම සඳහා කරන ලද හදීසයක් ගැළපෙන බව වැටහේ. අවධානයෙන් සවන් දෙන්න.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමාට මෙසේ ප්‍රකාශ කළහ:

"දරුවා, මම ඔබට කරුණු කිහිපයක් කියා දෙන්නෙමි. අල්ලාහ්ගේ මගපෙන්වීම රැක ගනිමින් ක්‍රියා කරන්න. එවිට අල්ලාහ් ඔබ ආරක්ෂා කරයි. ඔබ ප්‍රාර්ථනා කරන්නේ නම් අල්ලාහ්ගෙන් ම ප්‍රාර්ථනා කරන්න. ඔබ උපකාර පතන්නේ නම් අල්ලාහ්ගෙන් ම උපකාර පතන්න. මේ මුළු ලෝකය ම එකට එක් ව යහපත සිදු කිරීමට උත්සාහ කළ ද ඔබට අල්ලාහ් මීට ඉහත දී නිර්ණය කළ දෑ හැර වෙනත් කිසි දු යහපතක් සිදු කළ නොහැකි ය. මේ මුළු ලෝකය ම එකට එක් ව ඔබට අයහපත සිදු කිරීමට උත්සාහ කළ ද, ඔබට අල්ලාහ් මීට ඉහත දී නිර්ණය කළ දෑ හැර වෙනත් කිසි දු අයහපතක් සිදු කළ නොහැකි ය. "පන්හි ද ඉවත්කරන ලදී. ලිපි වියළී යන ලදී." (තිර්මිදි)

සිසුන්:- ජසාකල්ලාහු කයිරා.

අභ්‍යාස

හරි වැරදි ලකුණු කරන්න.

01. කලා කද්ර් පිළිබඳ විශ්වාසය ඉලාහියියාත් යන අංශය තුළ අන්තර්ගත වේ. ( )

02. මිනිසාගේ කැමැත්ත අකමැත්ත අල්ලාහ් දන සිටින්නේ ය. ( )

03. මිනිසාගේ ක්‍රියාකාරකම්වලට නියත වශයෙන් ම වගකිව යුතු තත්ත්වයක් මිනිසාට ඇත. ( )

ක්‍රියාකාරකම්

01. කලා කද්ර් පිළිබඳව පැහැදිලි කරන අල්කුර්ආන් වැකි දෙකක් හා හදීස් දෙකක් සිංහල පරිවර්තනය සමග ලියා ප්‍රදර්ශනය කරන්න.

02. ජයග්‍රහණයෙන් අසීමිත ව මුසපත් වූ හෝ පැරදුමෙන් දැඩි ශෝකයට පත් වූ හෝ ඔබගේ මිතුරකු සංසුන් කිරීමට ඔබ ඔහුට උපදෙස් ලබා දෙන්නේ කෙසේ ද?